# මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 7 වන සභා වාරයේ
# 2025.09.09 වන දින පැවති 4වන මාසික මහා සභාවේ
# රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
- ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය
- ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා
- ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා
- ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා
- ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා
- ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා
- ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා
- ගරු මන්ත්‍රී හෂිත සුබෝදන මාරතුඩුවගේ මහතා
- ගරු මන්ත්‍රී පී.ජී.බසින්ද්‍යා පුෂ්පමාලි මිය
- ගරු මන්ත්‍රී සමල්ෂා උෂාදි විජේවික්‍රම මෙය
- ගරු මන්ත්‍රී දිල්කා හන්සිකා අබේසුන්දර මෙය
- ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා
- ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2025 සැප්තැම්බර් මස මාසික සභා රැස්වීම 2025.09.09 වන දින ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව 9.30ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ කරන ලදී.

## 01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

2025 අගෝස්තු මස 12 වන දින පැවති මහා සභාවේ වාර්තාව සම්මත කිරීම.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

## 02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන -

තංගල්ල නගර සභාවේ මිය ගිය සියලු දෙනා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරනවා ඒ වගේම සියලුම නිලධාරීන් එකතු වෙලා දකුණු පළාතේ ආයතනයක් මඟින් මේ වනවිට එකතු කරලා තියන වැඩිම මුදල වන රු.90,000.00ක මුදලක් එකතු කරලා තියනවා පරිත්‍යාග කරන්න. කැමති අයට ඒ සඳහා දායකත්වය ලබා දෙන්න පුළුවන්.විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වා මිය ගිය සියලු දෙනා වෙත ගෞරවය දක්වමු.

ඒ අනුව සියලු දෙනා නැගී සිටිමින් විනාඩියක නිශ්ශබ්දතාවක් පවත්වා ගෞරව දක්වන ලදී.

**03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.**

- පළාත් පාලන දෙපාර්තමේන්තුව(දකුණු පළාත) විසින් එවන ලද''සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පවරා ගැනීම සහ ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීම''යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම (පෙ.ව 9.50 සිට)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඉහත සභාගත කළ ලිපිය සම්බන්ධව කාරක සභාවේදී සාකච්ඡා කරන ලදී.

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම (පෙ.ව 9.55)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**
මේ ලිපිය සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මන්ත්‍රීවරු සියලු දෙනා ස්ථානීය පරීක්ෂණයක් සිදුකර ලබන මහා සභාවෙන් පසුව තීරණයක් ගනිමු.

- දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් එවන ලද''මගී බස් ආවරණ වල දැන්වීම් පුවරු අලවා අපවිත්‍ර කිරීම''යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**
සභාව මඟින් නඩත්තු කටයුතු සිදු කර වියදම් වාර්තාව දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත යවමු.

- සංවර්ධන නිලධාරී P.K.R.S.සංජීව මයා විසින් ඉදිරිපත් කරන ලද''භාවිතයට ගත නොහැකි සහ වගකීම් කාලයක් නොමැති විදුලි බුබුළු වෙන්දේසි කිරීම''යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**
බල්බ් වෙන්දේසිය ඉක්මනින් සිදු කරන්න කටයුතු කරමු.

- සංවර්ධන නිලධාරී P.K.R.S.සංජීව මයා විසින් ඉදිරිපත් කරන ලද''වීදි පහන් අලුත්වැඩියාව සඳහා ගබඩාවෙන් ලබා දෙනු ලබන විදුලි බල්බ ප්‍රමාණය සම්බන්ධවයි''යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**
දැනට ගබඩාවෙන් දෛනිකව වීදි පහන් නඩත්තුව සඳහා බල්බ 15යි නිකුත් කරන්නේ.ඒ ප්‍රමාණය සමහර දවස් වලට ප්‍රමාණවත් නැති නිසා බල්බ 25ක් දක්වා ඒ ප්‍රමාණය වැඩි කරමු.

- සමගි ජන බලවේගය මඟින් එවන ලද''මන්ත්‍රී දීමනාවෙන් පක්ෂ අරමුදලට මුදල් බැර කිරීම සම්බන්ධවයි ''යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

- හොරගොඩ,තෙලිජ්ජවිල,ඒ.සී.එම්.සනූන් විසින් එවන ලද''2025 වර්ෂය සඳහා සෝතනාගාර බලපත්‍රය ලබා ගැනීම සම්බන්ධවයි''යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**

මං කියනවා මේ බලපත්‍රය දෙන්න ඕන කියලා.මොකද අපි මේ බලපත්‍රය නුදුන්නත් නීත්‍යානුකූල නොවන විදියට හරි මස් වෙළදාම සිදුවනවා.ඒ මස් ආහාරය සඳහා සෞඛ්‍ය ආරක්ෂිත වෙන්නෙ නෑ.මිනිසුන්ට සෞඛ්‍ය ආරක්ෂිත ලෙස මස් මිලදී ගැනීමේ පදනම මත මේ බලපත්‍රය ලබා දියයුතු බව මගේ අදහස.ඒ හරහා සභාවට ආදායමකුත් ලැබෙනවා.ඔබතුමාලාගේ අදහස් ඉදිරිපත් කරන්න.

## 04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.

## 05. යථා පරිදි කල්දී ඇති යෝජනා

**යෝජනා අංක 5:1**

2025.07.31 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2025.07.31 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 5:2**

2025.08.04 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ඒ අනුව 2025.08.04 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 5:3**

2025.08.27 දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා

ඒ අනුව 2025.08.27 දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 5:4**

2025.08.27 දින පැවති ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

ඒ අනුව 2025.08.27 දින පැවති ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:5</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2025.08.01 දින ලිපියෙන් දන්වා ඇති පරිදි මාලිම්බඩ පේෂ කර්ම පාසල පිහිටි හෙක්ටයාර් 0.0623 ක ඉඩම් ප්‍රමාණය ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 4/14/5799 අනුමත ලිපියට අනුව 2023.02.10 දිනැති පැවරුම් සහතිකය මඟින් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා දී ඇති බැවින් 2025.07.15 වන දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි සභාවට හිමිකම් නොමැති උක්ත ඉඩම ඉඩම් ගොඩනැගිලි ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2025.08.01 දින ලිපියෙන් දන්වා ඇති පරිදි මාලිම්බඩ පේෂ කර්ම පාසල පිහිටි හෙක්ටයාර් 0.0623 ක ඉඩම් ප්‍රමාණය ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 4/14/5799 අනුමත ලිපියට අනුව 2023.02.10 දිනැති පැවරුම් සහතිකය මඟින් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා දී ඇති බැවින් 2025.07.15 වන දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි සභාවට හිමිකම් නොමැති උක්ත ඉඩම ඉඩම් ගොඩනැගිලි ලේඛනයෙන් ඉවත් කිරීම කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:6</u>**

තෙලිජ්ජවිල,වල්පිට,කෝන්ගහවත්තෙහි පදිංචි එදිරිසූරිය ආරච්චිගේ ඩේවිඩ් අප්පුහාමි විසින් තෙලිජ්ජවිල,කද්දුව ප්‍රධාන මාර්ගයේ සිට තල්ගස් අද්දර වල්පිට ප්‍රජා ශාලාවට වූ ගම්සභා පාරට ප්‍රවේශ මාර්ගයක් සකස් කිරීම සඳහා ඉහල දෙපැල කුඹුර වී කුරුණි 01 යි ½ වපසරිය සභාවට පවරා දී ඇත.එම කුඹුරට අයත් බිම් ප්‍රමාණය දැනට භෞතිකව මාර්ගයක් ලෙස පවතින බැවින් 2025.07.15 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි උක්ත කුඹුර ඉඩම් ගොඩනැගිලි ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඒ අනුව තෙලිජ්ජවිල,වල්පිට,කෝන්ගහවත්තෙහි පදිංචි එදිරිසූරිය ආරච්චිගේ ඩේවිඩ් අප්පුහාමි විසින් තෙලිජ්ජවිල,කද්දුව ප්‍රධාන මාර්ගයේ සිට තල්ගස් අද්දර වල්පිට ප්‍රජා ශාලාවට වූ ගම්සභා පාරට ප්‍රවේශ මාර්ගයක් සකස් කිරීම සඳහා ඉහල දෙපැල කුඹුර වී කුරුණි 01 යි ½ වපසරිය සභාවට පවරා දී ඇත.එම කුඹුරට අයත් බිම් ප්‍රමාණය දැනට භෞතිකව මාර්ගයක් ලෙස පවතින බැවින් 2025.07.15 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි උක්ත කුඹුර ඉඩම් ගොඩනැගිලි ලේඛනයෙන් ඉවත් කර මාර්ග ලේඛනයට ඇතුළු කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:7</u>**

ගල්පමුණ ප්‍රජා ශාලාවට ජල සැපයුම ලබා ගැනීමටත් පවතින විදුලි සැපයුම ක්‍රමවත්දැයි සුදුසු අයෙකු ලවා පරික්ෂා කිරීමටත් සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා
ඒ අනුව ගල්පමුණ ප්‍රජා ශාලාවට ජල සැපයුම ලබා ගැනීමටත් පවතින විදුලි සැපයුම ක්‍රමවත්දැයි සුදුසු අයෙකු ලවා පරික්ෂා කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:8</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගර්භණී මව්වරුන්ගේ පෝෂණ ඌනතා අවම කිරීම සඳහා අවධානය යොමු කරමින් ශරීර සුවතා හා පෝෂණය පිළිබඳ වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් සකස් කරන ලද රු.58100.00 දළ ඇස්තමේන්තුව සභා සම්මත කර ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| **වියදම් දරනු ලබන කාරණය** | | **වියදම් මුදල** |
|---|---|---|
| 01.සම්පත්දායක දීමනා | | |
| i. **ශරීර සුවතා වැඩසටහන** (පැයට රු.1200.00 බැගින් පැය 4ක් සඳහා) | රු.1200*පැය 4 | රු.4800.00 |
| ii. පෝෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (පැයට රු.1200.00 බැගින් පැය 5ක් සඳහා) | රු.1200*පැය 5 | රු.6000.00 |
| 02.සංග්‍රහ වියදම් (ප්‍රතිලාභීන් 100ක් වෙනුවෙන් උදෑසන තේ සඳහා) | | |
| i. කුරක්කන් කැඳ සඳහා<br>ii. කෙසෙල් 12kg<br>iii. කට්ලට් සඳහා | රු. 70*100<br>රු.150*12<br>රු. 35*100 | රු. 7,000.00<br>රු. 1,800.00<br>රු. 3,500.00 |
| | | රු.12,300.00 |
| දිවා ආහාරය සඳහා | රු.350*100 | රු.35,000.00 |
| **එකතුව රු.4800+6000+12300+35000** | | **රු.58,100.00** |

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම (පෙ.ව 10.25)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ගර්භණී මව්වරුන්ගේ වැඩසටහන හා ඒ සඳහා මව්වරුන් තෝරා ගන්නා ආකාරය පිළිබඳව කාරක සභාවේදී සාකච්ජා කරන ලදී.

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම (පෙ.ව 10.30)

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා

ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගර්භණී මව්වරුන්ගේ පෝෂණ ඌනතා අවම කිරීම සඳහා අවධානය යොමු කරමින් ශරීර සුවතා හා පෝෂණය පිළිබඳ වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් සකස් කරන ලද රු.58100.00 දළ ඇස්තමේන්තුව සභා සම්මත කර ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

<u>**යෝජනා අංක 5:9**</u>

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බාල,මහළු,වැඩිහිටි හා තරුණ ප්‍රජාවගේ රසවින්දන හැකියාවන් වර්ධනය කිරීම හා එහි ගුණාත්මක හරයන් පෙන්වා දීම තුළ සමාජ ප්‍රගමනයක් ඇති කිරීමේ අරමුණින් ගීත රසවින්දන වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් සකස් කරන ලද රු.183750.00ක දළ ඇස්තමේන්තුව සභා සම්මත කර ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම (පෙ.ව 10.39)
යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

වර්තමානයේ පාසල් ළමුන්ගේ රසවින්දන හැකියාව අඩු මට්ටමක පවතින බැවින් වැඩි වශයෙන් පාසල් ළමුන් හා තරුණ ප්‍රජාව මෙම වැඩසටහන සඳහා සහභාගී කරගැනීම පිළිබඳව කාරක සභාවේදී සාකච්ඡා කරන ලදී.

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම (පෙ.ව 10.46)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

<u>**ඉහත අංක 5:9 යෝජනාව ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා විසින් පහත පරිදි සංශෝධනය කරන ලදී.**</u>

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාසල් ළමුන් හා තරුණ ප්‍රජාවගේ රසවින්දන හැකියාවන් වර්ධනය කිරීම හා එහි ගුණාත්මක හරයන් පෙන්වා දීම තුළ සමාජ ප්‍රගමනයක් ඇති කිරීමේ අරමුණින් ගීත රසවින්දන වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් සකස් කරන ලද රු.183750.00ක දළ ඇස්තමේන්තුව සභා සම්මත කර ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| වියදම් දරනු ලබන කාරණාව | | වියදම් දරනු ලබන මුදල |
|---|---|---|
| 01.සම්පත්දායක දීමනා ගෙවීම (රත්න ශ්‍රී විජේසිංහ ශූරීන් සඳහා | | රු.50,000.00 |
| 02.සංගීත භාණ්ඩ කුලියට ගැනීම | | |

| | | |
|---|---|---|
| i. තබ්ලා 01 ක්<br>ii. වයලීන 01ක්<br>iii. ගිටාර් 01ක්<br>iv. සර්පිනාව 01ක්<br>v. ඩොලැක්කිය 01ක්<br>vi. ඕගන් 01ක් | | රු.5,000.00<br>රු.5,000.00<br>රු.5,000.00<br>රු.5,000.00<br>රු. 5,000.00<br>රු. 5,000.00 |
| | | රු.30,000.00 |
| 03.ශබ්ද විකාශන යන්ත්‍ර හා මයික්‍රෆෝන කුලියට ගැනීම | | රු.35,000.00 |
| 04.සංග්‍රහ කටයුතු<br>(300 ක් පමණ පිරිසක් සඳහා) | | |
| i. කට්ලට්<br>ii. කේක් 25kg<br>iii. කිරි පැකට් | රු.35*350<br>රු.1000*25<br>රු.90*350 | රු.12,250.00<br>රු.25,000.00<br>රු.31,500.00 |
| | | **රු.68,750.00** |
| **එකතුව 50,000+30,000+35,000+68750** | | **රු.183,750.00** |

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාසල් ළමුන් හා තරුණ ප්‍රජාවගේ රසවින්දන හැකියාවන් වර්ධනය කිරීම හා එහි ගුණාත්මක හරයන් පෙන්වා දීම තුළ සමාජ ප්‍රගමනයක් ඇති කිරීමේ අරමුණින් ගීත රසවින්දන වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් සකස් කරන ලද රු.183750.00ක දළ ඇස්තමේන්තුව සභා සම්මත කර ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:10</u>**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ 2025 වර්ෂයට අදාළ සාමාජික මුදල වන රු.15000.00ක මුදල ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය නමින් තිඹිරිගස්යාය ශාඛාවේ අංක 0009330603 දරණ ගිණුමට බැර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම (පෙ.ව 10.50)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඉහත යෝජනාවේ සඳහන් සංසදය පිළිබඳ නවක මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම හා එහි වරප්‍රසාද පිළිබඳ සාකච්ඡා කරන ලදී.

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම (පෙ.ව 10.55)

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා

ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඒ අනුව ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ 2025 වර්ෂයට අදාළ සාමාජික මුදල වන රු.15000.00ක මුදල ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය නමින් තිඹිරිගස්යාය ශාඛාවේ අංක 0009330603 දරණ ගිණුමට බැර කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:11</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ බිම්මල් ව්‍යාපෘතිය හා එහි සාධාරණීකරණ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ බිම්මල් ව්‍යාපෘතිය හා එහි සාධාරණීකරණ වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:12</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ තවාන් පැළ ව්‍යාපෘතිය හා එහි සාධාරණීකරණ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ තවාන් පැළ ව්‍යාපෘතිය හා එහි සාධාරණීකරණ වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:13</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ බිම්මල් වගාව සම්බන්ධ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහනෙහි වියදම් ඇස්තමේන්තු මුදල වන රු.150,000.00ක මුදල අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා

**<u>යෝජනා අංක 5:14</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මිරිදිය ඉස්සන් වගා ව්‍යාපෘතිය හා එහි සාධාරණීකරණ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මිරිදිය ඉස්සන් වගා ව්‍යාපෘතිය හා එහි සාධාරණීකරණ වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම (පෙ.ව 11.10)

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

ඉහත යෝජනාවල සඳහන් ව්‍යාපෘති පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කරන ලදී.

මහා සභාවක් බවට පත් කිරීම (පෙ.ව 11.20)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

**<u>යෝජනා අංක 5:15</u>**

2026 සංචාරක සංවර්ධන සැලැස්ම සඳහා මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මඟින් සකස් කරන ලද ව්‍යාපෘති යෝජනා හා එහි ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ

**<u>ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා</u>**

ගරු සභාපතිතුමනි,ඔබතුමා ඉදිරිපත් කරන ලද සංචාරක සංවර්ධන සැලැස්ම යටතේ මාලිම්බඩ ප්‍රදේශයේ සංචාරකයින් හොරගොඩ ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන තිබුණු සර්ප ප්‍රදර්ශනය තුළ තමයි අපි වැඩිපුරම දැකලා තියෙන්නේ.මං න්‍යාය පත්‍රයට යෝජනාවකුත් දැම්මා.පසුගිය කාලයේ ඇතිවුණු නීතිමය තත්ත්වය තුළ එය මාලිම්බඩින් සම්පූර්ණයෙන්ම අයින් වෙලා තියනවා.මාලිම්බඩට යම් මුදලක් ලැබෙන්න තිබුණු අවස්ථාව සම්පූර්ණයෙන්ම නැතිවෙලා එය වැලිගමට ගලාගෙන ගිහින් තියනවා.නැවත මේ වැඩසටහන ක්‍රියාත්මක කරොත් මාලිම්බඩට ඒ මුදල් ලබාගන්න පුළුවන්.ඒ නිසා මං ඉල්ලීමක් කරනවා මේ ව්‍යාපෘතියටම ඇතුළත් කරලා විදේශ පැමිණීම නැවත වරක් මාලිම්බඩට ලබාගන්න වැඩසටහනක් ආරම්භ කරන්න කියලා.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

මන්ත්‍රීතුමා,ඒ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරේ නැත්තේ ඒ සම්බන්ධව ගැටලුවක් තියනවා වනජීවි ආඥා පනත යටතේ සතුන් රදවා ගන්න අවසර නෑ.පසුගිය කාලෙත් වැටලීම් කලා.නීතිමය තත්ත්වයන්ට යටත් වෙලා තමයි ඒ දේවල් කරන්න වෙන්නෙ.ඒකයි න්‍යාය පත්‍රයට ඒ යෝජනාව ඇතුළත් කලේ නැත්තේ.

ඒ අනුව 2026 සංචාරක සංවර්ධන සැලැස්ම සඳහා මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මඟින් සකස් කරන ලද ව්‍යාපෘති යෝජනා හා එහි ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:16</u>**

හොරගොඩ පාතෙගම පාරේ විදාපත්ත අසලින් ආරම්භ වන ඕපිට ගම්මානයට යාමට ඇති එකම මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය

**<u>ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා</u>**

ගරු සභාපතිතුමනි,හොරගොඩ විදාපත්ත කඩේ අසලින් ආරම්භ කරන මාර්ගය තමයි විදාපත්ත මාර්ගය.ඒ එක්කම දකුණු පැත්ත කුඹුරු යායෙන් එපිටට තියන ගම තමයි ඕපිට ගම්මානය කියන්නේ.මේ ගමට එන්න කිසිම පාරක් නෑ.එකම පාර තිබුණේ සත්ත්ව වෙද ගෙදරින් ආරම්භ වෙලා එන පාරේ කනංකඩේ ලඟින් තිබුණු පාර.නීතිමය තත්ත්වයක් හේතුවෙන් මේ වෙනකන් හදාගන්න බැරිවෙලා තියනවා.අවුරුදු ගානක නඩුවක් තියනවා.ඒ ගම්මානයට මිනී පෙට්ටියක්වත් ගෙනියන්න තිබුණු පාර තමයි ඒකෙන් නැතිවුණේ.මේ ගමේ ඉන්නවා ප්‍රියංකර කියලා මහත්තයෙක් එතුමගේ පුද්ගලික වියදමින් කුඹුරින් කොටසක් මිලදී ගන්නවා.පුද්ගලික මුදල් ගෙවලා ගත්තට පාරට ඉඩ ප්‍රමාණය මදි නිසා තව බිම් ප්‍රමාණයකුත් අරගෙන ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ අවසර පතනවා මේක පාරක් බවට පත් කරගන්න අවස්ථාව දෙන්න කියලා.ඒ වෙලාවෙදි ගොවිජන සේවා කාරක සභාව අදාල බල ප්‍රදේශයේ ගොවි සංවිධානයෙන් පාරක් හැදීමට සුදුසුද කියලා නිර්දේශයක් ඉල්ලනවා.සාමාන්‍යයෙන් ඕනැම කුඹුරු යායක පාරක් ගියොත් කුඹුරු යාය දෙකඩ වෙනවා.ඕන තරම් පාරවල් එහෙම පාරවල් හැදිලා තියනවා.ගොවි සංවිධානය නිර්දේශය දෙනවා මේකට අනුමැතිය දුන්නොත් වැරදි පූර්වාදර්ශයක් විය හැකි බැවින් මේකට විරුද්ධයි කියලා.එහෙම නිර්දේශය දීපු නිසා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව අවසර දෙන්නෙ නෑ මේක ගොඩ කරලා පාර හදන්න.මේ කුඹුර මිලදී ගනිපු මහත්මයා අවස්ථා කිහිපයකදී පස් දාලා පාර ගොඩ කරන්න උත්සහ කලා.එහිදී ගොවිජන සංවිධානය නඩු දැම්මා.මේ පුද්ගලයා කැමතියි පාරේ අවශ්‍යතාවය නිසාම මිලදී ගනිපු කොටස සභාවට පවරන්න.කලින් සභාවෙනුත් සහයෝගය ඉල්ලුවත් එය සිද්ධ වුනේ නැති නිසා ඒ මිනිස්සු බලාපොරොත්තු වෙනවා මේ සභාවෙන් ඒ කටයුතු සිද්ධ වෙයි කියලා.මේ පාර හදලා දුන්නොත් සභාවට ලොකු වටිනාකමක් ලැබෙනවා වගේම ඒ මිනිස්සුන්ගෙ ජන ජීවිතයටත් ලොකු වටිවාකමක් ලැබෙනවා.නීතිමය තත්ත්වයට ඔබතුමා මැදිහත් වෙලා මේ පාර හදලා දෙන්න කියන ඉල්ලීම කරමින් නවතිනවා ස්තූතියි.

ඒ අනුව හොරගොඩ පාතෙගම පාරේ විදාපත්ත අසලින් ආරම්භ වන ඕපිට ගම්මානයට යාමට ඇති එකම මාර්ගය සංවර්ධනය කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:17</u>**

හොරගොඩ කොරනිලගොඩවත්ත බෝගොඩවත්ත පාරේ දැඩි ලෙස හානී වී ඇති කෝරලේ දිවල කුඹුර අසල කඳු කොටස සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය

**<u>ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා</u>**

ඒ අනුව හොරගොඩ කොරනිලගොඩවත්ත බෝගොඩවත්ත පාරේ දැඩි ලෙස හානී වී ඇති කෝරලේ දිවල කුඹුර අසල කඳු කොටස සංවර්ධනය කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

## 6. යථා පරිදි කල් දී නොමැති යෝජනා.

<u>යෝජනා අංක 6:1</u>

2025.09.15 දින සිට සැප්තැම්බර් 21 දින දක්වා“පුනරුදයේ පුරවර”පළාත් පාලන සතිය -2025 වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ දළ වියදම් ඇස්තමේන්තුව වන රු. 456,818.00 මුදල අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | දිනය | වැඩසටහන | ස්ථානය | අපේක්ෂිත වියදම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | වියදම් දරණු ලබන කාර්ණය | ඒකකයක මිල (රු.) | ඒකක සංඛ්‍යාව | දළ වියදම් මුදල ( රු. ) |
| 01. | 2025.09.15 - ජංගම සේවා දිනය | 01.ආයුර්වේද සායනය (නිරාහාරව සිට සිදු කරන ලද රුධිර පරීක්ෂාව) | ගුණරතන විවේකාරාමය - සුල්තානාගොඩ | 01. සංග්‍රහ වියදම් - සමාරම්භක කටයුතු සඳහා. (බිස්කට්,කෙසෙල්,කේක්,තේ) | | | 5,500.00 |
| | | 02.රුධිර පරීක්ෂාව සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ හා ද්‍රව්‍ය සැපයුම් | | 02.කුරක්කන් කැඳ - 300 දෙනෙකු සඳහා | 35.00 | 300 | 10,500.00 |
| | | | | 03. කට්ලට් - 300 දෙනෙකු සඳහා | 40.00 | 300 | 12,000.00 |
| | | 03.ශ්‍රමදාන පැවැත්වීම | | 04.දිවා ආහාරය 75 දෙනෙකු සඳහා | 300.00 | 75 | 22,500.00 |
| | | 04.වීථි පහන් සැදීම | | 05. <u>රුධිර පරීක්ෂාවට අවශ්‍ය වෛද්‍ය උපකරණ සඳහා</u> | | | |
| | | 05.ප්‍රස්තකාල පාඨකයන් බඳවා ගැනීම | | viva check gluco strip | 2,256.00 | 12 | 27,072.00 |
| | | 06.කියවීම් කදවුර | | blood lancets | 4.75 | 300 | 1,425.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 07. මහජන පැමිණිලි හා අදහස් ලබා ගැනීම. | | surgical spirit 250ml | 300.00 | 1 | 300.00 |
| | | | | cotton wool 50g | 209.00 | 1 | 209.00 |
| | | | | surgical gloves | 100.00 | 1 | 100.00 |
| | | | | | | | **79,606.00** |
| | | | | | | | |
| 02. | 2025. 09.16 - පරිසර හා රුක් රෝපණ දිනය | 01. ප්‍රජාව දැනුවත් කිරීම හා පැළ ලබා දීම. | සුමේධ විද්‍යාලය - මාලිම්බඩ | 1.දේශක දීමනාව (පැය 4 * රු.1,200.00) | | | 4,800.00 |
| | | | | 2.සංග්‍රහ වියදම් (සිසුන් 200ක් සඳහා ) | | | |
| | | | | බීම | 25.00 | 200 | 5,000.00 |
| | | | | බිස්කට් | 1,500.00 | 2 | 3,000.00 |
| | | | | | | | **12,800.00** |
| | | | | | | | |
| 03. | 2025. 09.17 - සෞඛ්‍ය සහ සනීපාරක්ෂක දිනය | 01.ආයුර්වේද සායනය (නිරාහාරව සිට සිදු කරන ලද රුධිර පරීක්ෂාව) | කද්දුව පන්සල | සංග්‍රහ වියදම් අපේක්ෂිත ප්‍රතිලාභීන් 300ක් පමණ සඳහා කුරක්කන් කැඳ සහ කට්ලට් | | | |
| | | 02.රුධිර පරීක්ෂාව සඳහා | | 01.කුරක්කන් කැඳ - (300 දෙනෙකු සඳහා) | 35.00 | 300 | 10,500.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | අවශ්‍ය වෛද්‍ය උපකරණ හා ද්‍රව්‍ය සැපයුම් | | | | | |
| | | 03.ශ්‍රමදාන පැවැත්වීම | | 02. කට්ලට් - (300 දෙනෙකු සඳහා) | 40.00 | 300 | 12,000.00 |
| | | 04.වීථි පහන් සැදීම | | 03. දවල් කෑම -(75 දෙනෙකු සඳහා) | 300.00 | 75 | 22,500.00 |
| | | 05.ප්‍රස්තකාල පාඨකයන් බඳවා ගැනීම | | 04. <u>රුධිර පරීක්ෂාවට අවශ්‍ය වෛද්‍ය උපකරණ සඳහා</u> | | | - |
| | | 06.කියවීම් කඳවුර | | viva check gluco strip | 2,256.00 | 12 | 27,072.00 |
| | | 07. මහජන පැමිණිලි හා අදහස් ලබා ගැනීම. | | blood lancets | 4.75 | 300 | 1,425.00 |
| | | | | surgical spirit 250ml | 300.00 | 1 | 300.00 |
| | | | | cotton wool 50g | 209.00 | 1 | 209.00 |
| | | | | surgical gloves | 100.00 | 1 | 100.00 |
| | | | | | | | **74,106.00** |
| | | | | | | | |
| 04. | 2025.09.18 - ආදායම් ප්‍රවර්ධන දිනය | 01. ආදායම් එක්රැස් කිරීමේ ජංගම සේවය හා මහජන පැමිණිලි හා අදහස් ලබාගැනීම. | තෙලිජ්ජවිල පුස්තකාලය | 1. සහභාගී වන නිලධාරීන් සඳහා සංග්‍රහ වියදම - (නිලධාරීන් 40 ක් පමණ සඳහා) | 125.00 | 40 | 5,000.00 |
| | | | | | | | **5,000.00** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| 05. | 2025.09.19 - සාහිත්‍ය, අධ්‍යාපන හා පුස්තකාල ප්‍රවර්ධන දිනය | 01.ජංගම පුස්තකාලය හා මහජන අදහස් විමසීමේ ජංගම සේවය | හොරගොඩ විද්‍යාලය | 1. සිසුන් සහ නිළධාරීන් 200ක් පමණ සඳහා සංග්‍රහ වියදම | 50.00 | 200 | 10,000.00 |
| | | 02. ගීත රසවින්දන වැඩසටහන | කටුවන් ගොඩ විහාරය - මාලිම්බඩ | | | | |
| | | 03. කතන්දර පැය වැඩසටහන | සුමේධ මහා විද්‍යාලය - මාලිම්බඩ | | | | |
| | | | | | | | **10,000.00** |
| | | | | | | | |
| 06. | 2025.09.20 - මහජන උපයෝගීතා දිනය හා ක්‍රීඩා දිනය | 01.ආයුර්වේද සායනය | පරදුව කනිෂ්ඨ විද්‍යාලය | සංග්‍රහ වියදම් අපේක්ෂිත ප්‍රතිලාභීන් 300ක් පමණ සඳහා | | | |
| | | (නිරාහාරව සිට සිදු කරන ලද රුධිර පරීක්ෂාව) | | 01.කුරක්කන් කැඳ - (300 දෙනෙකු සඳහා) | 35.00 | 300 | 10,500.00 |
| | | 02.රුධිර පරීක්ෂාව සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ හා ද්‍රව්‍ය සැපයුම් | | 02. කව්ලව් - (300 දෙනෙකු සඳහා) | 40.00 | 300 | 12,000.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 03.ශ්‍රමදාන පැවැත්වීම | | 03. දවල් කෑම - (75 දෙනෙකු සඳහා) | 300.00 | 75 | 22,500.00 |
| | | 04.වීථි පහන් සැදීම | | 04. <u>රුධිර පරීක්ෂාවට අවශ්‍ය වෛද්‍ය උපකරණ සඳහා</u> | | | - |
| | | 05.ප්‍රස්තකාල පාඨකයන් බඳවා ගැනීම | | viva check gluco strip | 2,256.00 | 12 | 27,072.00 |
| | | 06.කියවීම් කඳවුර | | blood lancets | 4.75 | 300 | 1,425.00 |
| | | 07. මහජන පැමිණිලි හා අදහස් ලබා ගැනීම. | | surgical spirit 250ml | 300.00 | 1 | 300.00 |
| | | | | cotton wool 50g | 209.00 | 1 | 209.00 |
| | | | | surgical gloves | 100.00 | 1 | 100.00 |
| | | | | | | | **74,106.00** |
| | | | | | | | |
| 07. | 2025.09.20 - / 2025.09.21 ක්‍රීඩා දිනය හා සහතික පත්‍ර ප්‍රදානය හා සමාප්තිය | 01.ක්‍රීඩා උපකරණ ලබා ගැනීම. | උතුරු මාලිම්බඩ මහා විද්‍යාලය | 1. බෝල 15ක් සඳහා(රු.800.00 * 15) | 800.00 | 15 | 12,000.00 |
| | | | | 2. විකට් කූරු (යුගල 2*2400.00) | 2,400.00 | 2 | 4,800.00 |
| | | 02.විනිසුරු දීමනා | | 3.විනිසුරුවන් 03 දෙනෙක් සඳහා | 5,000.00 | 3 | 15,000.00 |
| | | 03.තරඟ සංවිධානය | | 4. මඩුව සඳහා(මඩුව අඩි 20 *40) | 20,000.00 | 1 | 20,000.00 |
| | | | | 5. කැනපි හට් (3*2000.00) | 2,000.00 | 3 | 6,000.00 |
| | | 04.ශබ්ද විකාශනය හා | | 6. ශබ්ද විකාශන යන්ත්‍රය | 15,00 | 1 | 15,000.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රචාරණය | | | 0.00 | | |
| | | | | 7. විස්තර ප්‍රචාරණය | 6,000 .00 | 1 | 6,000.00 |
| | | 05.සංග්‍රහ වියදම් | | 8. 300 දෙනෙකු සඳහා - බීම | 35.00 | 300 | 10,500.00 |
| | | | | 9. 100 දෙනෙකු සඳහා කෙටි කෑම | 40.00 | 100 | 4,000.00 |
| | | 06.තෑගි සඳහා | | 10. ශූරතාවය මුදල් තාගය හා කුසලානය | | | 25,000.00 |
| | | | | 11.අනු ශූරතාවය මුදල් තාගය හා කුසලානය | | | 15,000.00 |
| | | | | 12. තරඟාවලියේ වීරයා මුදල් ත්‍යාගය හා කුසලානය | | | 6,000.00 |
| | | | | 13.මුද්‍රණය කරන ලද මග් | 580.0 0 | 55 | 31,900.00 |
| | | 07අනෙකුත් වියදම් | | 14. සමාරම්භක කටයුතු | | | 10,000.00 |
| | | | | 15. ආරාධනාපත්‍ර මුද්‍රණය | | | 10,000.00 |
| | | | | 16. ජායාරූපකරණය | | | 10,000.00 |
| | | | | | | | **201,200.00** |
| | | | | | | | |
| **මුළු ඇස්තමේන්තු වියදම** | | | | | | | **456,818.00** |

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

මහා සභාව කාරක සභාව බවට පත් කිරීම (පෙ.ව 11.35)

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම(පෙ.ව 11.40)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

ඒ අනුව 2025.09.15 දින සිට සැප්තැම්බර් 21 දින දක්වා"පුනරුදයේ පුරවර"පළාත් පාලන සතිය -2025 වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ දළ වියදම් ඇස්තමේන්තුව වන රු.456,818.00 ක මුදල අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:2</u>**

ප්‍රසම්පාදන කටයුතු වලදී අවශ්‍ය වන ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය ලෙස පහත නම් සඳහන් අය පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

i. ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ii. ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
iii. ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා
iv. තාක්ෂණ නිලධාරී එම්.ඒ.කසුන් සමීර මහතා

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා

ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු වලදී අවශ්‍ය වන ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය ලෙස ඉහත නම් සඳහන් අය පත් කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:3</u>**

ප්‍රසම්පාදන අභියාචනාවක් සඳහා රු.15000.00ක ගාස්තුවක් අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

**<u>යෝජනා අංක 6:4</u>**

ගණන්දීමේ නිලධාරී සඳහා මූල්‍ය බලතල සීමාව ලෙස රු.100,000.00ක් අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඒ අනුව ගණන්දීමේ නිලධාරී සඳහා මූල්‍ය බලතල සීමාව ලෙස රු.100,000.00ක් අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:5</u>**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.9(3) වගන්තිය යටතේ ප්‍රසම්පාදන ක්‍රම සඳහා මූල්‍ය මට්ටම් පහත පරිදි අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

i. වෙළඳාපොල මිල සැදහුම් ක්‍රමය(National shopping method)-(උපරිම මිලියන 2 දක්වා)
ii. ජාතික තරඟකාරී ලංසු කැඳවීම ක්‍රමය(National competitive bidding method)-(උපරිම මිලියන 2 සිට මිලියන 50 දක්වා)
iii. සෘජු කොන්ත්‍රාත් ක්‍රමය(Direct contract method)-
- භාණ්ඩ හා සේවා - රු.20,000.00
- වාහන අලුත්වැඩියාව- රු.100,000.00

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා

ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.9(3) වගන්තිය යටතේ ප්‍රසම්පාදන ක්‍රම සඳහා මූල්‍ය මට්ටම් ඉහත පරිදි අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:6</u>**

1987ට පෙර ඉදිකිරීම් සඳහා නිකුත් කරන ලිපි (පැරණි ඉදිකිරීම් බව සනාථ කිරීමේ ලිපිය)සඳහා රු.2000.00ක මුදලක් අය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ඒ අනුව 1987ට පෙර ඉදිකිරීම් සඳහා නිකුත් කරන ලිපි (පැරණි ඉදිකිරීම් බව සනාථ කිරීමේ ලිපිය)සඳහා රු.2000.00ක මුදලක් අය කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:7</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල දෙක සඳහා 2025 ඔක්තෝම්බර් ජාතික කියවීමේ මාසයට අදාළ බැනරය සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

**"පුනරුදයක් සඳහා කියවමු"**
(Let's read for a revival)
2025- ජාතික කියවීමේ මාසය

තෙලිජ්ජවිල මහජන පුස්තකාලය
මාලිම්බඩ මහජන පුස්තකාලය

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල දෙක සඳහා 2025 ඔක්තෝම්බර් ජාතික කියවීමේ මාසයට අදාළ බැනරය සකස් කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**7) කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම. - නැත**

**8) ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

2025 මැයි,ජුනි,ජූලි,අගෝස්තු මස වරිපනම් ආදායම් වියදම් වාර්ථාව සභාවට ඉදිරිපත් කරන ලදී.

**9) වෙනත් කරුණු - නැත**

සභාපතිතුමාගේ ස්තූති කථාවෙන් පසු ප.ව 12.10 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව